# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2013-09-24

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති හා වැඩබලන ගරු සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | නගර සභා ගරු මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා අසනීප තත්ත්වය හේතුවෙන් මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා තිබුණි.

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එය කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු නගර සභා මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුළු සියළුම දෙනා ඉතාමත් සාදරයෙන් පිළිගන්නා බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදී.

පෞද්ගලික සංචාරයක් හේතුවෙන් මසකට මඳක් වැඩි කාලයක් විදේශ ගතව සිටීම හේතුවෙන් සභා වාර දෙකකට තමන් සහභාගී නොවූ අතර, එම කාලය තුළ ගරු උප සභාපතිතුමන් හට සභාපති ධූරයේ රාජකාරී කටයුතු ආවරණය සඳහා බලය පවරන ලද බව ද, එම මාසයක පමණ කාලය තුළ දී කණ්ඩායම් හැඟීමෙන් යුතුව සභාවේ සියළු කාර්යයන් ඉටු කළ ගරු උප සභාපතිතුමන්ට සහ නගර සභා මන්ත්‍රී කණ්ඩායමට ස්තුතිය පළ කරන බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

වෙනත් සභාවන්හි සාමාන්‍යයෙන් ඒ ආකාරයෙන් බලය පැවරීමක් සිදු නොවන බව ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලද අතර, 1991 වර්ෂයේ දී පළාත් පාලන ආයතනයන් වෙත පැවරුණු විධායක බලය හේතුවෙන් විශාල සේවාවක් ජනතාව වෙත සිදු කිරීමට අවකාශ ලැබුණු

බව ද එතුමන් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. සභාවක ගරු සභාපතිවරයාට අවශ්‍ය අවස්ථාවන්හි තනි තීරණය මත හෝ ක්‍රියාකිරීමට මෙමගින් හැකිවී ඇති බව ද සඳහන් කළ ගරු සභාපතිතුමන්, එම බලය නිවැරදි දේ සඳහා භාවිත කිරීමට බිය නොවිය යුතු බව ද, බිය විය යුත්තේ වැරදි කිරීමට බව ද අවධාරණය කරන ලදී.

ගරු නගර සභා මන්ත්‍රීතුමන්ලා වෙත සභාවේ න්‍යාය පත්‍රය යැවීමෙන් අනතුරුව ද ලිපි හා යෝජනා සභාවට ඉදිරිපත් කිරීමට ලැබී ඇති බැවින්, එම ලිපි ඇතුලත් වෙනම න්‍යාය පත්‍රයක් ද සකස් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, එම න්‍යාය පත්‍රය ද මහා සභා රැස්වීමට පෙර නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දී ඇති බව ද සඳහන් කරන ලදී. එමෙන්ම න්‍යාය පත්‍රයට ඇතුලත් නොවී සභාවේ සංවදයට ගන්නා කිසිදු කරුණක් නීත්‍යානුකූල නොවන බව ද එතුමන් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

බළන්ගොඩ නගරයේ මස් කඩ පවත්වාගෙන යාම සම්බන්ධව ගරුතර ස්වාමීන් වහන්සේ ඇතුළු විශාල පිරිසකගේ අත්සන් සහිතව පසුගිය මහා සභා වාරයට ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කළේ, මෙසේ හොර හරක් ප්‍රවාහනය කරන්නේ නම් ඒ සම්බන්ධව කටයුතු කිරීමේ හැකියාව ඇත්තේ පොලීසියට වන බවයි.

නගර සභා ආඥාපනත, ගෝ ඝාතක ආඥා පනත හා ආහාර පනත අනුව ජනතාවට අවශ්‍ය ආහාර සම්පාදනය සම්බන්ධව නිල බලය පළාත් පාලන ආයතනයක සභාපතිවරයා වෙත පැවරී ඇති බව ද, එම නීති උල්ලංඝනය කිරීමෙන් තීන්දු තීරණ ගැනීමට සභාවකට හැකියාවක් නොමැති බව ද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. ජනතාවට අවශ්‍ය කරන ආහාර ලබා ගැනීමට බාධා කළහොත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම යටතේ සභාවට එරෙහිව නීතිමය පියවර ගැනීමට පවා ජනතාවට හැකියාවක් ඇති බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

තමන් ද මස් ආහාරයට නොගන්නා නමුත්, මෙම සභාවේ සභාපතිවරයා වශයෙන් මාංශ නිෂ්පාදනයට අදාල කාර්යයන් සඳහා අත්සන් කිරීමට සිදුවන බව ද, පෞද්ගලිකව මස් කෑම සුදුසු යැයි පිළිනොගත්ත ද, පාරිභෝගික අවශ්‍යතාවය අනුව එසේ කිරීමට සිදුවන බව ද එතුමන් සඳහන් කරන ලදී,

පසුගිය වයඹ, මධ්‍යම සහ උතුරු පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් විපක්ෂය කවරකාර දෑ ප්‍රකාශ කළත් අතිගරු ජනාධිපතිතුමන් වෙත ජනතාව විශ්වාසය තැබූ බව ගරු සභාපතිතුමන් පෙන්වා දෙන ලදී. රට වෙනුවෙන් ගරු ජනාධිපතිතුමන් කෙරෙහි විශ්වාසය තබා ඡන්දය පාවිච්චි කළ වයඹ සහ උතුරුමැද පළාත් ජනතාවට ස්තුතිය පළ කරන බව ද, මහින්ද චින්තනය ඉටු කිරීම සඳහා සියළු දෙනාටම හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද ප්‍රකාශ කළේය.

එමෙන්ම, රාජ්‍ය සේවයේ දීර්ඝ කාලයක් රැඳී සිටිමින්, මෙම සභාවේ කාර්යාල කාර්ය සහායකවරයකු වශයෙන් සියළුම දෙනාගේ විශ්වාසය දිනාගත්, එම්. ජී. පේමදාස මහතා වයස අවුරුදු 60 සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම ගන්නා බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, තමන්ගේ ධූරකාල 03ක කාලය තුළම ඉතාමත් නිවැරදි, කාර්යක්ෂම හා විශ්වසනීය අයුරින් සේවය ලබා දීමට ඔහු කටයුතු කරන ලද බව ද සිහිපත් කරන ලද අතර තමන්ගේත් සභාවේත් ස්තුතිය පුද කරන බව ද වැඩි දුරටත් සඳහන් කරන ලදී. එමෙන්ම විශ්‍රාමික ජීවිතය මුනුබුරු මිනිබිරියන් සමඟ නිදහසේ ගත කිරීමට ඔහු හට හැකියාව ලැබේවා යි ප්‍රාර්ථනා කරන බව ද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

නගර සභා කාර්යාලයේ කාර්යාල කාර්ය සහායකවරුන් සඳහා පුරප්පාඩු පවතින බැවින්, එම තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතු බව ද ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා වාර්තාව සම්බන්ධව අදහස් දක්වමින්, මෙම සභාව ගලි බවුසර සේවය නගර වාසීන් වෙත අඛණ්ඩව ලබා දෙන බවත්, පරිසර හිතකාමී මල අපද්‍රව්‍ය ප්‍රතිකාරක පද්ධතියක් මෙම සභාවෙන් නිසි ආකාරව පවත්වාගෙන යන බවත් සඳහන් කරන ලද අතර, අවට ඇති වෙනත් ප්‍රාදේශීය සභාවන් වෙත ද පළාත් සභාවෙන් ගලි බවුසර ලැබී ඇතත් ඔවුන් එම සේවය ජනතාවට ලබා නොදෙන බව **ගරු සභාපතිතුමන්** විසින් ප්‍රකාශ කරන ලදී. මේ හේතුවෙන් මෙම සභාවේ ගලි

බවුසරයේ සේවය සභා බල ප්‍රදේශයෙන් පිට ලබා දීම සීමා කළ බව සඳහන් කළ එතුමන් ගලි බවුසරයේ ආදායම ඉහල ගිය බවට ගරු උප සභාපතිතුමන් විසින් පසුගිය සභාවාරයේ දී වැඩබලන ගරු සභාපතිවරයා වශයෙන් ප්‍රකාශ කිරීමට හේතුව විමසන ලදී.

එයට පිළිතුරු දෙමින් **ගරු උප සභාපතිතුමන්** ප්‍රකාශ කළේ, ගරු සභාපතිතුමන් විදේශගතව සිටින කාලයේ තමන් මෙම කර්මාන්ත සහ සෞඛ්‍ය යන අංශයන් කෙරෙහි වැඩි අවදානයක් යොමු කළ බව ප්‍රකාශ කළේය. එයට හේතුව වන්නේ නගර සභාව විසින් සපයන සේවාවන් විශේෂයෙන් කැපී පෙනෙන්නේ සහ ගැටලු ඇතිවීමට ඉඩකඩක් ඇත්තේ නගර සභාවේ අනෙකුත් අංශයන්ට වඩා කර්මාන්ත හා සෞඛ්‍ය යන අංශයන් වෙතින් වන නිසා බව ද, මේ හේතුවෙන් අදාල අංශ ප්‍රධානීන් කැඳවා අවශ්‍ය උපදෙස් ලබා දීම සිදුකළ බව ද ප්‍රකාශ කළේය.

ගලි බවුසරයේ සේවය ලබා දීම සම්බන්ධව මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වෙතින් ද විමසා බැලූ විට පෙර එහි රියදුරු වශයෙන් සේවය කළ තැනැත්තාට වඩා වර්තමානයේ කටයුතු කරන අමල් තුෂාර යන අයගේ සේවයේ වෙනසක් දක්නට ලැබෙන බව ද, පෙර මාස වල ලැබුවාට වඩා වැඩි ආදායමක් ගලි බවුසරයේ සේවය සැපයීමෙන් සභාවට ලබා ගැනීමට හැකියාව ලැබී ඇති බව ද, සඳහන් කරන ලදී. ධාවන සටහන් ආදිය සම්බන්ධව නිරන්තර අවධානයෙන් සිටීම මගින් ද මේ මගින් ලබා ගන්නා ආදායමේ කැපී පෙනෙන වෙනසක් දැක ගැනීමට අවස්ථාව ලැබුණු බව ද එතුමන් සඳහන් කරන ලදී.

ඒ සම්බන්ධව **ගරු සභාපතිතුමන්** ප්‍රකාශ කළේ, ආදායමේ වැඩිවීමක් දක්නට ලැබෙන්නේ ජුලි මාසයේ වන බවත්, ඉහත ආකාරයට සලකන්නේ නම් අගෝස්තු මාසයේ ද ආදායම වැඩි විය යුතු වුවත් එවන් වැඩි වීමක් දැකිය නොහැකි බවත්ය. එමෙන්ම තමන් ගලි බවුසරයේ සේවය පිට ප්‍රදේශ වලට ලබා දීමට ක්‍රියා නොකළ බව ප්‍රකාශ කළේය. එමෙන්ම මෙම සභාවේ රියදුරන් සඳහා පුරප්පාඩු රැසක් ඇති බව සඳහන් කළ එතුමන්, දැනට එම සේවාවන් ලබාගනුයේ සෞඛ්‍ය කම්කරු තනතුර යටතේ බඳවා ගත් පුද්ගලයන් වෙතින් බව ද සඳහන් කරන ලදී.

**නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන්** විසින් කරුණු දක්වමින්:, පසුගිය මහා සභාවේ දී තමන් යෝජනා කළ පරිදි බෙතල්හිල් මාවත ඉහල කොටසේ පස් ඉවත් කර දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. නගර සභාවට අයත් නොවන ප්‍රදේශයක් වශයෙන් ඇතැමුන් හැඳින්වුව ද එම ප්‍රදේශය මෙම සභා බල ප්‍රදේශයට අයත් බව එතුමන් විසින් පෙන්වා දෙන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී මලික් ෂා මැතිතුමන් විසින් දක්වන ලද පරිදි බෙතල්හිල් මාවත නගර සභා බල ප්‍රදේශයට අයත් බව ප්‍රකාශ කළ **ගරු සභාපතිතුමන්,** අදාල කොටසේ පස් ඉවත් කර දීමට පියවර ගන්නා බව ප්‍රකාශ කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 අංක ඩී - 17 කඩ කාමරය කුලියට ලබා ගැනීම - පී. ඩබ්. ඒ. පී. පෙරේරා මහතා

බලන්ගොඩ බස් නැවතුම්පොල අංක ඩී 17 දරන කඩ කාමරය මාසික කුලී පදනම මත ලබා දෙන මෙන් පී. ඩී. ඒ. පී. පෙරේරා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, මාසික කුලී පදනම මත එම කාමරය අදාල අය වෙත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:02 ගලි බවුසරයේ සේවය ලබා ගැනීම - ර/බළ/කුමාර විද්‍යාලය**

මෙම සභාවේ ගලි බවුසරයේ සේවය ලබා දෙන මෙන් ර/බළ/කුමාර විද්‍යාලයේ විදුහල්පතිතුමන් විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, විදුහලකට අවශ්‍ය සේවාවක් නිසා එම සේවය නොමිලේ ලබා දීමට එතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

**06:03 බදු අය කිරීමේ ජංගම සේවාවක් පැවැත්වීම - ආදායම් අංශය**

2013 වර්ෂයේ ඉදිරි මාස වල බදු අය කිරීමේ ජංගම සේවාවන් පහත ස්ථානයන්හි පැවැත්වීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

- ඇල්ලෙපොල දර්ශන මහතාගේ නිවස අසළ
- පහල ඇල්ලෙපොල
- බෝම්බුව ප්‍රජාශාලාව
- මුගුණමලේ
- ඕලුගංතොට මහිලා සමිති ගොඩනැගිල්ල

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 සතිපොල කාමරයක් ලබා ගැනීම - ඩී. වී. රංජිත් මයා**

බලන්ගොඩ මහජන පොලේ වැසිකිළියට යාබදව ඇති හිස්කාමරය උපකරණ තබා ගැනීම සඳහා ලබා දෙන මෙන් ඩී. වී. රංජිත් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ජල හා විදුලි සම්බන්ධතා අදාල අය විසින් ලබා ගැනීමට යටත්ව එය ගබඩා කාමරයක් වශයෙන් මාසිකව රු. 7,500.00 කුළියට ලබා දීමට එතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 ඉරිදා පොල කඩකාමරයක් කුලී පදනම මත ලබා ගැනීම - ඩී. වී. රංජිත් මයා**

ඉරිදා පොල කඩකාමරයක් ලබා දෙන මෙන් ඩී. වී. රංජිත් මයා විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, එය රු. 7,500.00ක මාසික කුලී පදනම මත ලබා දීමට එතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 ඩී - 26 නව බස් නැවතුම්පොල කඩ කාමරයේ හිඟ මාසික කුලී මුදල් සම්බන්ධවයි - ජනත් එරාන් ද සිල්වා මහතා**

තමන් බරපතල ලෙස රෝගාතුරව සිටි බැවින් බස් නැවතුම්පොල ජී - 26 කඩ කාමරයේ මාස කිහිපයක කුලිය ගෙවීමට නොහැකි වූ බවත්, මෙතෙක් ගෙවීමට හැකි හිඟ මුදල අතහැර 2013.09.01 වන දින සිට නැවත කඩ කුලිය අය කර ගන්නා මෙන් ජනත් එරාන් ද සිල්වා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, දඩ මුදල් අය නොකර, හිඟ මුදල් පමණක් අය කර එම කඩ කාමරය ඔහු හට කුලී පදනම මත ලබා දීමට එතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 2013 - ඔක්තෝබර් ජාතික කියවීම් මාසය වැඩසටහන ඉදිරිපත් කිරීම**

2013 - ඔක්තෝබර් ජාතික කියවීම් මාසයේ වැඩසටහන ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කළ අතර, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, 2013 ඔක්තෝබර් කියවීම් මාසය වෙනුවෙන් මහජන පුස්තකාලය විසින් සිදුකිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් පිළිබඳව පැහැදිලි කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 ගිවිසුම අවලංගුකර දේපල නැවත පවරා ගැනීමේ නිවේදනය සම්බන්ධව - පී. ඩී. මහින්ද චන්ද්‍රරත්න මයා**

පැරණි සතිපොල අසළ ගොඩනැගිලි ඉවත් කිරීම සඳහා අදාල ගිවිසුම් අවලංගු කර නැවත පවරා ගැනීමට යවන ලද නිවේදනයට අනුව පී. ඩී. මහින්ද චන්ද්‍රරත්න මහතා සහ තවත් අය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. එම ලිපියෙන් ඉල්ලා ඇති පරිදි නව වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමේ දී කඩ කාමර ලබා දෙන විට එම අයට ප්‍රමුඛතාවය ලබා දීමට එතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර එම ස්ථානයේ නොයෙකුත් දුරාචාරයන් සිදුවන බැවින් අදාල කඩ පේලිය ඉවත් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. මේ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 2014 වර්ෂය සඳහා රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීම**

2014 වර්ෂය සඳහා බලන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමට 2014 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2014 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලයට බදු දීම සඳහා සුදුසු බදු කරුවන් තෝරා ගැනීමට විවෘත ටෙන්ඩර් කැඳවීමට අවශ්‍යව ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී. එමෙන්ම පසුගිය වර්ෂයේ අදාල බදු දීමේ දී පිළිගනු ලැබූ මිල ගණන රු. 73,350.00 වන බව එතුමන් විසින් වැඩි දුරටත් සඳහන් කරන ලද අතර, ලබන වර්ෂය සඳහා රු. 100,000.00කට ටෙන්ඩර් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 2014 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මස් කඩ ටෙන්ඩර් කිරීම**

පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 2009/01 හි උපදෙස් අනුව පොදු වෙළඳසැල අංක 15, 16, 17 දරන මස් කඩ 2014 වර්ෂය සඳහා බදු දීම කළ යුතු බව ද, 2013 වර්ෂයට අදාල බදු දීමේ කටයුතු කිරීමේ දී ඊට පෙර වර්ෂයේ දී පිළිගනු ලැබූ මිල ගණන් වලට 10%ක මුදලක් එකතු කර අවම ලංසුව සකස් කර ටෙන්ඩර්පත් කැඳවනු ලැබුව ද, එම අවම ලංසුව පාදක කර ගනිමින් කිසිදු ඉල්ලුම්පතක් ඉදිරිපත් නොවූ බවත්, එබැවින් මහා සභා තීරණයක් මත එම 10% මුදල අඩු කර නැවත ටෙන්ඩර් කැඳවන ලද බවත් එහි දි පහත පරිදි ඉදිරිපත් වූ බවත් ගරු සභාපතිතුමන් විසින් සභාවට දන්වන ලදී.

- පොදු වෙළඳසැල අංක 15 දරන එළු මස් කඩය - රු. 6,300.00
- පොදු වෙළඳසැල අංක 16 දරන හරක් මස් කඩය - රු. 125,050.00
- පොදු වෙළඳසැල අංක 17 දරන කුකුල් මස් කඩය - රු. 26,716.00

මෙම මස් කඩ කාමර දැනට ඇති මුදලටම ටෙන්ඩර් කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එමෙන්ම, ඌරු මස් කඩයක් සඳහා ටෙන්ඩර් කැඳවීමට ද, එහි ලංසු මුදල වශයෙන් රු. 7,500.00ක් දැක්වීමට ද එතුමන් යෝජනා කරන ලදී.

ඉහත යෝජනාවන් ගරු නගර සභා මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, ගරු මන්ත්‍රීතුමන්ලා විසින් මේ සම්බන්ධව පහත පරිදි අදහස් ඉදිරිපත් කරන ලදී.

**ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා** කරුණු ඉදිරිපත් කරමින් කියා සිටියේ හරක් මස් කඩය ටෙන්ඩර් කිරීමට තමා විරුද්ධ බව ද, දැනට පෞද්ගලික ස්ථානයක ගව ඝාතනාගාරය පවත්වාගෙන යන බැවින් නගර සභාවට අයත් ස්ථානයක එම කාර්යය සිදු කිරීම සුදුසු බව ද සඳහන් කළේය. පසුගිය සභාවේ දී ද සංවාදයට ලක් කළ පරිදි වර්තමානයේ සිදුවන අමානුෂික අන්දමින් ගවයන් ප්‍රවාහනය සහ ඝාතනය නැවැත්වීමට එයින් හැකියාවක් ලැබෙනු ඇති බවද එතුමන් විශ්වාසය පළ කරන ලදී.

මස් කඩයක් වසා දැමීමට සභාවට නොහැකි බව සඳහන් කළ **ගරු සභාපතිතුමන්** වැඩිදුරටත් ප්‍රකාශ කළේ එසේ කිරීමට අවශ්‍ය නම් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර, ඒ හරහා පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම කළ යුතු බවයි. මෙය දීර්ඝ ක්‍රියා පටිපාටියක් බව සඳහන් කළ ගරු සභාපතිතුමන්, එතෙක් සභාවට කළ හැක්කේ වසරකට වරක් ප්‍රසම්පාදන පටිපාටිය යටතේ මස් කඩ ලංසු කැඳවීම පමණක් බව ද පෙන්වා දුන්නේය. එමෙන්ම මේ සඳහා වන නිසි බලධාරියා වන්නේ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

මෙම සභාවට ගෝ ඝාතනාගාරයක් ආරම්භ කිරීමට ඇති හැකියාව සම්බන්ධව මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙතින් විමසීමට කාරක සභා අවස්ථාවක් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපතිතුමන් විසින් එය ස්ථිර කර සහා සම්මත වීමෙන් පසු මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.

***මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා***

*ගෝ ඝාතනාගාරයක් ආරම්භ කිරීමට ක්‍රියා පටිපාටියක් තිබෙනවා. පළමුව අදාල ගෝ ඝාතකාගාරය යම් ඉඩමක ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව දන්වා පුවත්පත් දැන්වීමක් ප්‍රකාශයට පත් කළ යුතුයි. දැනට ඇති ගෝ ඝාතකාගාරය බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත්ව තිබී 2003 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව සමඟ නඩුවකින් මෙම සභාවට ලබා ගත් එකක්. මෙය සේවාවක් වශයෙන් සභාව විසින් පවත්වාගෙන යා යුතු බවට මහාධිකරණයෙන් නියෝගයක් දුන්නා. ඒ අනුව 51/4 වශයෙන් වරිපනම් අංකයක් ලබා දී එම ස්ථානයේ ගෝ ඝාතකාගාරයක් ආරම්භ කළා. දැන් එම ගෝ ඝාතකාගාරය නීත්‍යානුකූලයි.*

*මෙහි වෙනත් අයකුට ගව ඝාතනය කිරීමේ හැකියාවක් නොමැති දැයි ගරු **උප සභාපතිතුමන්** විසින් කරන ලද විමසීමට පිළිතුරු දෙමින්*

*මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා:*

*මෙහි නගර සභාවට හැකියාව තිබෙන්නේ සේවාව පවත්වාගෙන යාමටයි. පෙර ගව ඝාතනාගාරය පිහිටා තිබුණේ යසෝදරා අඳ ගොලු බිහිරි පාසැල ආසන්නයේ. එයට විරුද්ධව අධිකරණයේ නඩුවක් පැවරුණා. පසුව එය වසා දැමීමට අධිකරණයෙන් නියෝග කළා. ඒ සම්බන්ධයෙන් ෆලීල් මුදලාලි මහාධිකරණයට ගියා නියෝගයට විරුද්ධව. නගර සභාව ද එම නඩුවේ පාර්ශවකාරයකු බවට පත්*

*වුනා. මෙම ස්ථානයේ අයිතිය නගර සභාව සතු බව පෙන්වා දීමෙන් පසු, ඒ සඳහා වෙනත් ස්ථානයක් ඉදිරිපත් කිරීමට මහාධිකරණය නියෝග කළා. ඒ අනුවයි දැනට ඇති ස්ථානය තෝරා ගනු ලැබුවේ.*

*වෙනත් තැනක මරන ලද ගවයන්ගේ මස් ගෙන ඒමට හැකි දැයි* ***ගරු සභාපතුමන්*** *විසින් විමසන ලදී.*

***මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා:***

*මස් ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ඇති අයකු හට එසේ කළ හැකියි.*

***ගරු සභාපතිතුමා***

*මෙවර ටෙන්ඩර් කිරීමේ දී දිවයිනේ ඕනෑම කෙනෙකුට ටෙන්ඩරය ලබා ගත හැකි බව ඇතුලත් කළ යුතුයි. පළාත් සභාවෙන් හෝ ජනාධිපතිතුමන් විසින් මස් කඩ වසා දැමීමට තීන්දුවක් ගතහොත් මිස සභාවට එවන් තීරණයක් ගත නොහැකියි. එයින් ලැබෙන රු. ලක්ෂ 15ක පමණ ආදායම නැතිව යනවා. එයින් කිරීමට ඇති සංවර්ධනය අඩාල වනවා. විදුලිබිල් ගෙවීම්, වැටුප් ගෙවීම් ඇතුළු අත්‍යවශ්‍ය වියදම් කළ යුතුම බැවින් සංවර්ධන කටයුතු සඳහා ඇති මුදල් කපා හැරීමට සිදුවනවා. දැනට සභාවට උසාවි දඩ ලැබීම අඩුයි. සභාවට සැලකියයුතු ආදායමක් ලැබෙන්නේ පොදු වෙළඳසැලෙන්. මෙවර මස් කඩ ටෙන්ඩර් කිරීමේ දී ගෝ ඝාතනාගාරයක් තිබිය යුතුයි යන කොන්දේසිය ඇතුලත් නොකළ යුතුයි.*

***ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*නගර සභාවට අයත් නීත්‍යානුකූල ස්ථානයක ගව ඝාතනය සිදු කළ යුතුයි. එවිට, සභාවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු සිදු වන බැවින් නීති විරෝධී ගව ඝාතන සිදු කළ හැකි වන්නේ නෑ. එවිට සභාවට එයින් දැනට වඩා වැඩි ආදායමක් ලබා ගැනීමට ද හැකි වනවා. පිටින් ගෙනැවිත් විකුණන මස් සම්බන්ධව ද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් සොයා බැලීම කළ යුතුයි. උදෑසන බස් රථ වලින් ද බණ්ඩාරවෙල සහ බදුල්ල ප්‍රදේශ වලින් නගරයට මස් ගෙන එනවා.*

*මා කිසිම මසක් කන්නේ නෑ. සත්ත්ව ඝාතනයටත් විරුද්ධයි. බල්ලන් පවා නොමරණ රටක කිරි මව වශයෙන් සලකන එලදෙන මැරීම නුසුදුසුයි. සිංහල දෙමළ මුස්ලිම් සියළු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත විය යුතුයි.*

***ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*පසුගිය වර්ෂයේ දෙසැම්බර් මස මහා සභාවේ දී ගරු උප සභාපතිතුමන් විසින් යෝජනා කළා ගව මස් කඩ සඳහා ඉඩ ලබා දෙනවා නම් ඌරු මස් කඩයක් ද අනිවාර්යයෙන් විවෘත කළ යුතු බව. එහි දී මම පැහැදිලිව ප්‍රකාශ කළා ඉදිරියේ දී එම අවස්ථාව පැමිණි විට කටයුතු කිරීමට. ඒ සම්බන්ධව තීරණයක් ගැනීම සම්බන්ධව අද ගරු සභාපතිතුමන්ට ස්තූතිවන්ත වනවා. සිංහල, දෙමළ හා මුස්ලිම් යන සියළුම ජනතාවට සාධාරණයක් ඉටුවිය යුතු බැවින් ඌරු මස් කඩයක් ආරම්භ කිරීම සුදුසුයි. යම් හේතුවකින් ගව මස් කඩය නතර වුවහොත් එහි ආදායම වුව ඌරු මස් කඩයෙන් ලබා ගැනීමට හැකිවෙයි. වෙනත් නගරවල ප්‍රසිද්ධියේ ඌරු මස් එල්ලා තිබෙනවා.*

*එමෙන්ම මෙම සභාවේ කොතැනකදී හෝ ප්‍රකාශ කර නෑ ගව මස් කඩය නැවැත්වීමට තීන්දු තීරණ ගෙන ඇති බව. නීත්‍යානුකූලව සහ පිරිසිදුව මස් ලබා ගැනීමට මුස්ලිම් ජනතාව ඇතුළු සියළු දෙනාට අයිතියක් ඇති නිසා නගර සභාවට අයිතිය ඇති ගෝ ඝාතකාගාරයක් සෑදීම කළ යුත්තේ.*

*දැනට ඇති ගෝ ඝාතකාගාරය නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරනවා නම් ඉතා සුදුසුයි. එයට අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දෙනවා.*

*නීත්‍යානුකූලව සහ පිරිසිදුව කටයුතු සිදු නොවනවානම් මගෙත් කැමැත්තක් නෑ ගව ඝාතකාගාරය සම්බන්ධව.*

***ගරු සභාපතිතුමා***

*දැනට ඇති ගව ඝාතකාගාරය නගර සභාවට පවරා ගැනීමට ඇති හැකියාව ගැන සොයා බලන්න.*

***ගරු උප සභාපතිතුමා***

*පොදු වෙළඳසැලේ පණපිටින් කුකුලන් ප්‍රදර්ශනය වන පරිදි තබා තිබෙන්නේ. පාරිභෝගිකයකු ඉල්ලූ විට එතැන දීම මරා මස් බවට පත්කර ලබා දෙනවා. මේ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවා දැයි මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් විමසනවා*

***මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා***

*නගර සභාවට කළ හැකි පහසුම දේ එය වසා දමන එක. නමුත්, එයත් නගර සභාවට අයත් එකක්. එම ස්ථානය පවත්වාගෙන යන පුද්ගලයාටත් එතන වෙළඳාම නෑ. නගරයේ සෑම තැනම කුකුල් මස් විකුණන නිසා. කඩකුලිය ගෙවාගැනීමට හෝ ඔහුට ලාභයක් ගත හැකි එකම අවස්ථාව වන්නේ සජීවී කුකුලන් මරා විකිණීම පමණයි. කුකුල් මස් කඩය වසා දමන එක ලේසියි. මට නගර සභාවේ නිලධාරියකු වශයෙන් නගර සභාවට ආදායමක් අහිමි වන අවස්ථාවක් සඳහා නිර්දේශ ඉදිරිපත් කළ නොහැකියි.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

*ගව ඝාතනය සම්බන්ධයෙන් මෙම සභාවේ කිසිදු නගර සභා ගරු මන්ත්‍රීවරයකු විරුද්ධ නෑ. ඔවුන් පැහැදිලිවම ගව ඝාතනයට ඉඩ දෙන බව ප්‍රකාශ කළා. ස්වාමීන් වහන්සේලා කතා කරන්ගේ ගව ඝාතනයට විරුද්ධව. අපගේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විරුද්ධ වන්නේ පවතින ගව ඝාතනාගාරයට. එමෙන්ම ගව ඝාතනාගාරය නීත්‍යානුකූලව පැවතිය යුතුයි කියා ප්‍රකාශ කළා. ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළා මුස්ලිම් ජනතාවගේ ආහාරය මස් බව. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ මස් කඩ 2500කට වඩා තිබෙනවා. දිනකට 5000කට වඩා ගවයන් මස් පිණිස මරණවා. හලාවත, වෙන්නප්පුව, මීගමුව, මොරටුව වැනි ප්‍රදේශ වල මුස්ලිම් ජනතාවට නොවෙයි මස් ප්‍රවාහනය කරන්නෙ. පසුගිය දිනක ගවයන් ප්‍රවාහනය කරන ලොරියකින් ගවයකු වැටී තුවාල වී මිය ගිය බව පැවසුවා. නමුත් එය මුස්ලිම් ජාතිකයන් විසින් පැදවූ ලොරියක් නොවේ. මුස්ලිම් නියෝජිතයකු වශයෙන් මා ප්‍රකාශ කරන්නේ, එය කවුරු අරන් ගියා යැයි කීවත් වැරදියි. නීත්‍යානුකූලව සියළු දේ පැවතිය යුතුයි. ඒ දේ කවුරු කළත් සියයට සියයක් වැරදියි. ඒ නිසා, එදින ගරු වැඩබලන සභාපතිතුමන් මේ සම්බන්ධව ඉදිරිපත් කළ විට මා හෝ නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් හෝ මේ සම්බන්ධව කිසිවක් ප්‍රකාශ කළේ නෑ. එයට හේතුව වන්නේ යමක් ප්‍රකාශ කරන විට කරුණු දැන ප්‍රකාශ කළ යුතු නිසයි. මස් කඩයක් හෝ මාලු කඩයක් ළඟට ගොස් බලන්න. මුස්ලිම් ජනතාව මෙන්ම, බෞද්ධ, හින්දු හා කතෝලික ජනතාව ද මිල දී ගැනීමට පැමිණෙනවා. මා හරක් මස් ගන්නේ මාසයකට එක් වරක් පමණයි. මස් කන මෙන්ම මස් නොකන මුස්ලිම් ජාතිකයන් ද සිටිනවා. උප සභාපතිතුමා ප්‍රකාශ කළා හරක් මස් කඩයක් දැමීමට දෙනවා නම් ඌරු මස් කඩයකුත් දැමිය යුතුයි කියා. අදටත් මා*

*පෞද්ගලිකව මුස්ලිම් ජාතික මන්ත්‍රීවරයකු වශයෙන් එයට සම්පූර්ණ විරෝධතාවය පළ කරනවා. නමුත් සභාවට ඕනෑම තීරණයක් ගැනීමට හැකියාව තිබෙනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා***

*මෙම නගර සභාව ආරම්භ කළ කාලයේ සිට මස් කඩයක් තිබුණා. ඒ කාලයේ සිට තිබූ මස් කඩය වසනවාට මා කැමති නෑ. නාගරිකව වෙසෙන මුස්ලිම් ජනතාවගේ ආහාරය වන්නේ මස්. මුස්ලිම් ජනතාව පමණක් නොවෙයි අනෙක් ජනතාවත් මස් ආහාරයට ගන්නවා. මස් කඩය වැසුවා යැයි මුස්ලිම් ජනතාවට පාඩුවක් වන්නේ නෑ. අනෙක් අයටයි පාඩුවක් වන්නේ. ඌරු මස් කඩය දමනවාට මා තදින්ම විරුද්ධ වනවා. අපට මුස්ලිම් ජනතාවගෙන් ඡන්දයක් හෝ ඉල්ලීමට යාමට නොහැකි වනවා.*

***ගරු උප සභාපතිතුමා***

*අප ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරනවා. නමුත් අවස්ථාවාදය ගැන අප කතා කරන්නේ නෑ. ඡන්දය ගැන කතා කරන්නේ නෑ. මේ අය ඌරු මස් කඩ දමනවාට විරුද්ධයි. හරක් මස් කෑමට අවශ්‍යයි කියනවා. හරක් මස් විශේෂ ආහාරයක් ද නොවෙයි කියනවා. නමුත් ඇයි හරක් මස් කන්නෙ? අප ගව ඝාතනයට විරුද්ධයි. නමුත් මුස්ලිම් ජාතිය සමඟ සහෝදරත්වයෙන් ජීවත් වීමට අවශ්‍ය නිසයි ඒ අවසරය හෝ ලබා දෙන්නෙ. අප ඔබලාගේ අයිතිවාසිකම් ගැන සැලකිලිමත් වුවත්, ඔබලා ඒ අයිතිවාසිකම් ගැන සලකන්නේ නෑ. අප පොදුවේ කතා කරන්නෙ. අප ගරු කළ යුත්තේ පෞද්ගලික මතයන්ට නොව පොදු මතයටයි. අප දක්වන අදහස් දෙස මිනිසුන් බලා සිටිනවා. ඒවා පුවත්පත් වල පළකෙරෙනවා. අපේ ජනාධිපතිතුමාවත් රජයවත් ජාති වාදය අවුස්සා ඡන්ද ලබා ගැනීමට උත්සාහ කරන්නේ නෑ.*

කාරක සභා අවස්ථාව අවසන් වූ පසු, ඉහත යෝජනාවන් බහුතරයේ කැමැත්තෙන් මහා සභාවේ සම්මත විය.

**06:11 බස් නැවතුම්පොල කඩ කාමරයක් ලබා ගැනීම - නන්දා විලේගොඩ මිය**

දැනට බස්නැවතුම් පොල සී 45 කඩ කාමරය වසා දමා ඇති බැවින් එය තමා වෙත ලබා දෙන මෙන් බලන්ගොඩ, වැලිගෙපොල, පනාන, වෙද මැදුර යන ස්ථානයේ පදිංචි නන්දා විලේගොඩ යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලද අතර හිඟ කඩ කුලී ගෙවීමෙන් අනතුරුව එම අයට අදාල කඩ කාමරය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 2014 - වර්ෂය සඳහා ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීම**

2014 වර්ෂයට බදු පැනවීම සඳහා සභා තීරණයක් ගෙන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුව ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, නගර සභා ආඥා පනත අනුව අය කළ හැකි උපරිම බදු හා බලපත්‍ර ගාස්තු 2013 වර්ෂයේ දී පනවා ඇති බැවින් එම ප්‍රමාණයෙන්ම 2014 වර්ෂයට ද බදු අය කිරීම කළ යුතු බව මහා සභාවට දන්වන ලදී.

**06:12:01 2014 - වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම**

255 වන නගර සභා ආඥාපනතේ 165 ආ වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165 අ වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2014 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් , බද්දට යටත් සෑම තැනැත්තකුම එකී ව්‍යාපාර බද්ද 2014 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

උපලේඛනය

| | I වන තීරුව | II වන තීරුව |
|---|---|---|
| | **බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය** | **ගෙවිය යුතු බද්ද රු. ශත** |
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90.00 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180.00 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360.00 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට | 1,200.00 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000.00 |

| | |
|---|---|
| 01. | දූරකථන සේවා |
| 02. | නියෝජිත තැපැල් කාර්යාල |
| 03. | පොදු සේවා ස්ථාන |
| 04. | කොන්ත්‍රාත්කරුවන් |
| 05. | රක්ෂණ නියෝජිතයින් |
| 06. | මූල්‍ය ආයතන |
| 07. | පෞද්ගලික ආරෝග්‍යශාලා |
| 08. | බ්‍රෝකරවරුන්/ වෙන්දේසි කිරීම |
| 09. | ඇඟලුම් කර්මාන්තශාලා |
| 10. | කොමිස් නියෝජිතයින් |
| 11. | සිනමා ශාලා |
| 12. | උකස් බඩු ගන්නා ස්ථාන |
| 13. | ඉන්ධන පිරවුම්හල් |
| 14. | රටබීමඅලෙවිසැල් (මත්පැන්) |
| 15. | ලොතරැයි අලෙවිකිරීම |
| 16. | විවිධ සේල් ස්ථාන |
| 17. | රන්භාන්ඩ උකස් සේවාව |
| 18. | යම් ලාභ උපයන ව්‍යාපාරයක් හෝසේවා සපයන ආයතනයක් |
| 19. | ඉඩකඩම් හා ගොඩනැගිලි අලෙවි කිරීම |
| 20. | සේවා සැපයෙන ස්ථාන |
| 21. | රථවාහන හා යන්ත්‍ර සූත්‍ර කුලියටදීම |
| 22. | වෛද්‍ය සේවවන් පවත්වා ගෙනයාම |
| 23. | රන් භාණ්ඩ නිපදවීම හා අලෙවිකිරීම |
| 24. | ගොඩනැගිලි උපකරණ හා ද්‍රව්‍ය අලෙවි කිරීම |
| 25. | රෙදිපිළි හා නිමි ඇඳුම් අලෙවි කිරීම |
| 26. | ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් අලෙවි කිරීම |

| | |
|---|---|
| 27. | ලී වෙළඳාම |
| 28. | යතුරු පැදි හා වාහන අමතර කොටස් අලෙවි කිරීම |
| 29. | රියදුරු පුහුණු ස්ථානයක් සඳහා |
| 30. | පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් සඳහා |
| 31. | රෙදිවෙළඳ සැලක් සඳහා |
| 32. | සිල්ලර බඩු වෙළඳ සැලක් සඳහා |
| 33. | කුළුබඩු මිළට ගැනීමේ හා අලෙවි කරණ ස්ථානයක් පවත්වාගෙනයාම |
| 34. | බිස්කට් තොග වෙළඳ ස්ථානයක් පවතාවා ගෙනයාම |
| 35. | ප්‍රචාරක දැන්වීම් අඳින ස්ථානයක් පවත්වා ගෙනයාම |
| 36. | පෞද්ගලික ළදරු පාසලක්පවත්වා ගෙනයාම |
| 37. | මිශ්‍ර වෙළඳාමක් පවත්වා ගෙනයාම |
| 38. | යකඩ කම්හලක් පවත්වා ගෙනයාම |
| 39. | ලියවන පට්ටලයක් පවත්වා ගෙනයාම |
| 40 | සත්ත්ව ආහාර ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් සඳහා |
| 41. | රෙස් ඔට්ටු එකතු කරන ස්ථානයක් පවත්වා ගෙනයාම |
| 42. | සිගරට් තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා |
| 43. | බයිසිකල් අමතර කොටස් හෝ බයිසිකල් විකිණීමේ ස්ථානයක් සඳහා |
| 44. | පොත්පත් ලිපිද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 45. | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 46. | රා තබෑරුමක් පවත්වා ගෙනයාම |
| 47. | සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙනයාම |
| 48. | උළු හෝ ගඩොල් ගබඩාකර තබා ගැනීම සඳහා |
| 49. | දර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 50. | දැව ගබඩාවක් පවත්වා ගෙනයාම සඳහා |
| 51. | මෝටර් රථ අමතර කොටස් අලෙවි කිරීම සඳහා |
| 52. | බෙලෙක් වැඩපලක් පවත්වා ගෙනයාම සඳහා |
| 53. | මෝටර් වාහන සඳහා බොඩි නිපදවන ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 54. | මොටර් රථ සර්විස් කරන ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 55. | ඉඩම් විකුණනහා රථ වාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම |
| 56. | සේවා සපයන යම් ස්ථානයක් පවතක්වා ගෙනයාමසඳහා |
| 57. | දේශීය ඩිස්පෙන්සරියක් පවත්වා ගෙනයාම සඳහා |
| 58. | බටහිර ඩිස්පෙන්සරියක් පවත්වා ගෙනයාම සඳහා |
| 59. | උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක්සඳහා |
| 60. | සමූපකාර ප්‍රාදේශිකයක් පවත්වා ගෙනයාම සඳහා |
| 61. | පාවහන් වෙළඳසැලක් පවත්වා ගෙනයාම සඳහා |
| 62. | ගෘහ භාණ්ඩ අලෙවිසැලක් පවත්වා ගෙනයාම සඳහා |
| 63. | ඉංග්‍රීසි බෙහෙත් විකිණීම සඳහා |
| 64. | ආයුර්වේද ඖෂධ විකිණීම සඳහා |
| 65. | ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා |
| 66. | පරිඝණක අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙනයාම සඳහා |
| 67. | ග්‍රොසරියක් පවත්වා ගෙනයාම සඳහා |
| 68. | නගර සභා කඩ කාමර /පොදු වෙළඳසැල වනපාර සඳහා |
| 69. | එක් ආයතනයක් තුල වෙළඳ කටයුතු කිහිපයක් පවත්වා ගෙනයාම සඳහා |
| 70. | වෙළඳ නියෝජිත සීථානයක් සඳහා |
| 71. | භාණ්ඩ නිෂ්පාදිත ආයතනයක සඳහා |

**06:12:01 2014 - වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම**

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 අ වන වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් , එම උප ලේඛනයේ II වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් , එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2014 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බලන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ හෙයින් මහා සභාවේ සම්මත විය.

**උපලේඛනය**

| | I වන තීරුව | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
| | | 750 නොඉක්මවන අවස්ථාවක | 750ට වැඩි එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1,500 ඉක්මවන අවස්ථාවක |
| 1 | කුෂන් වැඩ කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 2 | ගීත පටිගත කිරීම හෝ තැටිගත කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 3 | ඇස් කණ්නාඩි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 4 | දැව ඉරුම් පට්ටලයක් (ලී මෝලක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 5 | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500'00 | 750'00 | 1000.00 |
| 6 | ස්වර්ණාභරණ නිපදවීම හා/හෝ විකිණීම | | | 1000.00 |
| 7 | බයිසිකල් හා/හෝ බයිසිකල් අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | පින්තූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 9 | ටයර් හෝ ටියුබ් විකිණීම හා / හෝ වොල්කනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | මෝටර් බයිසිකල් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | මැටිභාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 12 | උළු අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | සිමෙන්ති ගඩොල් නිපදවීම හා/හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ලී බඩු අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | මිනීපෙට්ටි විකිණීම හා/හෝ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | බ්රේක් ලයිනර් විකිණීම හා/හෝ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ජල පොම්ප අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | ජංගම දුරකථන අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | ටයිල් අලෙවිකිරීම හා/හෝ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | වාහන අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | ඇළුමිණියම් භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | වීදුරු භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | පිත්තල භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | ඇඹරුම්හලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | මැණික් කැපීම හා ඔපදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | ලී වෙළඳසැලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 29 | ලියවන පට්ටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | ගමන් මලු හෝ පාවහන් සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 31 | කොන්ක්‍රීට් නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 32 | පාවහන් අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |

**06:12:01 2014 - වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම**

ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරිය වු නගර සභා ආඥාපනතේ 164 (1) වගන්තිය අනුව නගර සභාව විසින් සාදන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ අංක 11263 හා 1958.02.21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත අන්ත්‍රාදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලෙස බළන්ගොඩ නගර සභාව විසින් පිළිගෙන ඇති පහත සඳහන් කර්මාන්ත සඳහා බළන්ගොඩ නගර සභාව විසින් 2014 වර්ෂය තුළ දී නිකුත් කරණු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර

සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එමහ උප ලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

**උපලේඛනය - අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර**

| 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|
| | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
| | 750 නො ඉක්මවන අවස්ථාවක | 750 ට වැඩි එහෙත් 1,500 නො ඉක්මවන අවස්ථාවක | 1,500 ඉක්මවන අවස්ථාවක |
| නවාතැන් පලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| හෝටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| බේකරියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගෝඝාතනාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| බත් කඩයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කිරිපට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මස් හෝ මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| වී මෝලක් පවත්වාගෙන යාම | 500'00 | 750'00 | 1000.00 |
| සත්ව ආහාර අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| දිය ලුණු පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| පපඩම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000'00 |
| කම්හල් පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| ගරාජ පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| වැල්ඩින් වැඩපලවල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මුද්‍රණාල පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බෝතල් /පත්තර/ගෝනි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 සී - 39 කඩකාමරය සම්බන්ධව - රාජ් කන්නා මයා**

තමන් බස් නැවතුම්පොල පවත්වාගෙන යනු ලබන සී 39 කඩකාමරයට අදාල පොත් දෛනිකව කිව් ඩබ් - 1369 දරන ත්‍රීරෝද රථයෙන් ප්‍රවාහනය කරන බැවින් එම ත්‍රී රෝද රථය ගාල් කිරීමේ ගාස්තුවෙන් නිදහස් කර දෙන මෙන් රාජ් කන්නා නැමති අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, බස් නැවතුම්පොල කඩකාමර බදු පදනම මත ලබාගෙන ඇති පුද්ගලයන්ගේ වාහන විශාල ප්‍රමාණයක් එහි නවත්වන බැවින්, අදාල ගාස්තු අය කිරීමේ අවශ්‍යතාවය එතුමන් විසින් පෙන්වා දී, එම වාහන සඳහා ද අනෙකුත් තැන් වල වාහන නැවැත්වීමේ දී අය කරන ගාස්තු ප්‍රමාණයන් අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 2013 මග නැගුම ගැටලු සාකච්ඡා කිරීම**

2013 මග නැගුම වැඩසටහන සම්බන්ධයෙන් ඇති ගැටළු ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත දන්වන ලදී.

***06:14:01 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*මග නැගුම යටතේ වන මාර්ග සංවර්ධනය සඳහා දැනට ඇති එකම ගැටලුව වන්නේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි සපයා ගැනීමේ අපහසුවයි.*

***06:14:01 ගරු උප සභාපතිතුමා***

*අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබා ගැනීමේ දී ගැටලුවක් ඇතිවුනා. සේනක බිල්ඩර්ස් ආයතනයේ අධිපතිතුමා සමග කතා කළ විට එම කුට්ටි ලබා දීමට එකග වුනා. දෙවරක් පමණ කුට්ටි ගෙන්වා ගත්තා. නමුත් පසුව එක්වරම සැපයුම නතර වුනා. මේ සම්බන්ධව කුමාර මහතා වෙතින් විමසූ විට, ගල් ගෙන්වීම නතර කරන්නට සභාපතිතුමා කී බව කියමින් පැවසූ බව ප්‍රකාශ කළා. නමුත් එවකට වැඩබලන සභාපතිවරයා වශයෙන් මා ඒ පිළිබඳව කිසිවක් දැන සිටියේ නෑ. මෙසේ කතා කළේ කවුද කියා ප්‍රශ්නයක් ඇති වුනා. පසුව නැවත එම කුට්ටි ගෙන එන මෙන් මා උපදෙස් ලබා දුන්නා. සැපයුම් නිලධාරී වෙතින විමසූ විට ප්‍රකාශ කළේ ඉල්ලා ඇති එම කුට්ටි ලක්ෂයක ප්‍රමාණය අතරින් ලැබී ඇත්තේ 11,000ක් පමණක් වන බවයි.*

***06:14:01 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

*දෙහිගස්තලාව අනුර මහතාගේ නිවාස වලට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ප්‍රමාණයක් ඉතිරි වනවා.*

එම මුදල් වලින් ඉතිරි නිවාස වලට යන මාර්ගයෙ පහළ කොටස ද සංවර්ධනය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එමෙන්ම අන්තර් සම්බන්ධිත කුට්ටි ලබා ගන්නා ආයතනයට ඉතිරි කුට්ටි ලබා ගැනීම රුපියල් ලක්ෂ 10ක අත්තිකාරම් මුදලක් ලබා දීමට ද, එක් එක් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙන මග නැගුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතින් සඳහා ඒවා ලබා දීමට ද ගරු සභාපතිතුමන් විසින් උපදෙස් ලබා දෙන ලදී.

**න්‍යාය පත්‍රය ගරු මන්ත්‍රීතුමන්ලා වෙත යැවීමෙන් පසු මහා සභාවට ඉදිරිපත් කිරීමට ලැබුණු ලිපි**

**06:15 කඩ කාමරයක් කුළියට ලබා ගැනීම - එම් මන්සූර් මයා**

බස් නැවතුම්පොල ඉහල මහලේ ඇති අංක 45 දරන කඩ කාමරය නගර සභාවේ තක්සේරු මුදලට ලබා දෙන මෙන් බළන්ගොඩ, කිරිඳිගල, 238 යන ස්ථානයේ පදිංචි එම්. මන්සූර් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දන්වන ලද අතර, එය තක්සේරු මුදලට අදාල අය වෙත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 මාස තුනක මුදල තැන්පත් මුදලින් අඩු කර දෙන මෙන් ඉල්ලා සිටීම - එම්. ආර්. එම්. අනාස් මයා**

තමන් විසින් පොද වෙළඳසැල පවත්වාගෙන යනු ලබන අංක 15 කඩ කාමරයට අදාල ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසයන්හි කුලිය තැන්පත් මුදලින් අඩු කර ගන්නා මෙන් එම්. ආර්. එම්. අනාස් නැමති අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම තැන්පත් මුදල් කඩකුලී සඳහා හිලව් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය .

**06:17 මාස තුනක මුදල තැන්පත් මුදලින් අඩු කර දෙන මෙන් ඉල්ලා සිටීම - එම්. ජේ. එම්. ඉම්රාන් මයා**

තමන් විසින් පොද වෙළඳසැල පවත්වාගෙන යනු ලබන අංක 17 දරන කුකුල් මස් කඩ කාමරයට අදාලව හිග නොමැතිව කුලිය ගෙවා ඇති බවත්, එම කඩයේ වෙළඳාම බොහෝ දුරට අඩු වී ඇති බවත්, ඉදිරි ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසයන්හි කුලිය තැන්පත් මුදලින් අඩු කර ගන්නා මෙන් එම්. ජේ. එම්. ඉම්රාන් නැමති අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම තැන්පත් මුදල් කඩකුලී සඳහා හිලව් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 මාස තුනක මුදල තැන්පත් මුදලින් අඩු කර දෙන මෙන් ඉල්ලා සිටීම - එෆ්. එම්. රවුසාන් මයා**

තමන් විසින් පොදු වෙළඳසැල පවත්වාගෙන යනු ලබන අංක 16 දරන එළහරක් මස් කඩයට අදාල ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසයන්හි කුලිය තැන්පත් මුදලින් අඩු කර ගන්නා මෙන් එෆ්. එම්. රවුසාන් නැමති අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම තැන්පත් මුදල් කඩකුලී සඳහා හිලව් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 පොදු වෙළඳසැල කඩ කාමරයක් ලබා ගැනීම - මිරාන් කාවින්ද මුතුමාල මයා**

බලන්ගොඩ පොදු වෙළඳසැලේ දැනට වසා ඇති අංක 12 දරන කඩ කාමරය ගබඩා කාමරයක් වශයෙන් පවත්වාගෙන යාමට මසකට රු. 2,000.00ක කුලියට ලබා දෙන මෙන් බලන්ගොඩ, රාස්සගල පාර පදිංචි මිරාන් කාවින්ද මුතුමාල යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එය ගබඩා කාමරයක් වශයෙන් එම අයට රු. 2,000.00 බැගින් කුලියට ලබා දීමට එතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 ප්‍රජා මූල සංවිධාන ව්‍යුහය - ආපදා කළමනාකරණ ඒකකය**

මෙම සභාවේ ආපදා කළමනාකරණ ඒකකයයෙන් ආරම්භ කර ඇති ප්‍රජා මූල සංවිධානයන්හි ව්‍යුහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:20 2014 වර්ෂයට අදාලව සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2014 ජනවාරි මස 01 වන දින සිට 2014 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ලිත් වර්ෂයක කාලයේ දී මෙම සභාවට භාණ්ඩ හා සේවා සපයා ගැනීමටත්, සභාවෙන් ලබා දෙනු ලබන කොන්ත්‍රාත් ලබා දීමටත්, සුදුසු සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් එකී වර්ෂයට අදාලව ලියාපදිංචි කිරීමටත්,

ඒ අනුව, ඊට අදාලව සකසන ලද සිංහල මාධ්‍ය දැන්වීම දිනමිණ පුවත්පතෙහි ද, දමිල මාධ්‍ය දැන්වීම තිනකරන් පුවත්පතෙහි ද, පළ කිරීමටත්, එම දැන්වීම අන්තර්ජාලයේ අපගේ වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධ කිරීමටත්, මෙම වර්ෂ වෙනුවෙන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වී ඇති අයවලුන් වෙත ලිඛිතව දැන්වීමටත්,

2013 වර්ෂය සඳහා එක් අයිතමයක් වෙනුවෙන් මෙම සභාවේ ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 500.00 බැගින් සහ එම මුදලට රජය විසින් අනුමත කර ඇති එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද එකතු කර අය කිරීම සිදු කරන ලද පරිදි ඉදිරි වර්ෂය සඳහා ද එම ගාස්තු යටතේ ලියාපදිංචිය සිදු කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. අදාල සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට අපේක්ෂිත අයිතමයන් ද එතුමන් විසින් පහත පරිදි ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | අයිතමය | හඳුනා ගැනීමේ පහසුව සඳහා යොදන ලද කේතය |
|---|---|---|
| UCB-01 | කාර්යාල උපකරණ සහ ලිපි ද්‍රව්‍ය සැපයීම | A |
| UCB-02 | වානේ ගෘහ භාණ්ඩ සහ ලී බඩු සැපයීම | B |
| UCB-03 | පරිගණක, පරිගණක උපාංග සහ මුද්‍රණ තීන්ත සැපයීම | C |
| UCB-04 | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීම | D |
| UCB-05 | මාර්ග නඩත්තු උපකරණ සහ ද්‍රව්‍ය සැපයීම | E |
| UCB-06 | නාම පුවරු, දැන්වීම්, සමරු ඵලක, බැනර්, කටවුට්, ඩිජිටල් පෝස්ටර් | F |
| UCB-07 | ක්‍රීඩා භාණ්ඩ, ළදරු පාසල් උපකරණ සැපයීම | G |
| UCB-08 | තීන්ත වර්ග සැපයීම | H |
| UCB-09 | විදුලි උපකරණ සැපයීම | I |
| UCB-10 | මුද්‍රණ කටයුතු, රබර් මුද්‍රා නිෂ්පාදන හා මුද්‍රිත ෆෝරම සැපයීම | J |
| UCB-11 | කාර්යාල උපකරණ අළුත්වැඩියාව | K |
| UCB-12 | වාහන සේවා හා අළුත්වැඩියා, වාහන අමතර කොටස් සැපයීම | L |
| UCB-13 | කුලී පදනම මත ටිපර් රථ/වාහන සැපයීම | M |
| UCB-14 | සෞඛ්‍ය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය සැපයීම | N |
| UCB-15 | පිඟන් භාණ්ඩ සැපයීම | O |
| UCB-16 | පුස්තකාල පොත් සැපයීම | P |
| UCB-17 | නිල ඇඳුම් සඳහා රෙදි වර්ග සැපයීම | Q |
| UCB-18 | වෙනත් අයිතමයන් සැපයීම | R |

ගරු නගර සභා මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ඉහත යෝජනාව ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කමිටුවේ සම්මත කරන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙවර මහා සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර මහා සභාවට ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11:01 නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා

11:01:01 නගර සභා ක්‍රීඩා පිටිය වලවල් සෑදී ක්‍රීඩා කිරීමට නොහැකි තත්ත්වයට පත්ව ඇති බැවින් එය සංවර්ධනය කිරීම

නගර සභා ගරු මන්ත්‍රී ඒ. අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, බළන්ගොඩ මහජන ක්‍රීඩාංගනය හොඳ තත්ත්වයේ පවතින බවත්, එහි පසුගිය මාසයේ ක්‍රීඩා උළෙලක් ද ඉතා සාර්ථකව පවත්වන ලද බවත් සඳහන් කරන ලදී.

### 11:02 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා

11:02:01 2014 වර්ෂයේ අයවැය ලේඛනය සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා වෙතින් අයවැය යෝජනා ලබා ගැනීම හා ආදායම් වැඩි කර ගැනීමට යෝජනා ලබා ගැනීම

11:02:02 2013 - 2016 සිව් අවුරුදු සැලැස්ම - සෞඛ්‍ය අංශය

11:02:03 ලබන මාසයේ විදේශ ගත වීම සඳහා නිවාඩු අනුමත කර ගැනීම

11:02:04 නගර සභාවේ ඇති සේවක පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීම

ඉහත යෝජනාවන් ගරු සභාපතිතුමන් මහා සභාවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලදී.

එම යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2013 අගෝස්තු මාසය සඳහා වන ලැබීම් විග්‍රහය

- 2013 අගෝස්තු මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 5,235,224.88 |
| වෙනත් ලැබීම් | 906,172.59 |
| **මුළු ලැබීම්** | **6,141,397.47** |
| පුනරාවර්තන වියදම් | 4,562,468.67 |
| වෙනත් වියදම් | 1,485,218.27 |
| **මුළු වියදම්** | **6,047,686.94** |

- බළන්ගොඩ තානායමේ 2013.08.01 වන දින සිට 2013.08.31 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම ද එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 2013.07.01 සිට 2013.07.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවන් හි ඉතිරිය සහ 2013.08.01 වන දින සිට 2013.08.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වාර්තාවන්**

2013.07.01 සිට 2013.07.30 වන දින දක්වා වාහන සඳහා පසුගිය සභාවට ඉදිරිපත් නොකළ ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව එම වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 164,443.10 කි.

2013.08.01 සිට 2013.08.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 709,438.05 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවන්ටට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**13:01 පුස්තකාල උපදේශක කමිටු රැස්වීම**

2013.09.11 වන දින පැවති බළන්ගොඩ මහජන පුස්තකාලයීය උපදේශන කමිටු රැස්වීමේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:01 කර්මාන්ත හා සංවර්ධන කමිටු වාර්තාව**

2013.09.11 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කමිටු රැස්වීමේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු:

**14:01 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා:**

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් මහා සභාව අමතමින්, 2013 පළාත් පාලන සතිය වෙනුවෙන් බළන්ගොඩ ප්‍රදේශයේ සියළුම රාජ්‍ය ආයතනයන් අතර මෙම සභාව මගින් පැවැත්වූ ක්‍රිකට් සහ දැල් පන්දු ක්‍රීඩා තරගාවලිය ඉතාමත් සාර්ථකව සිදු කිරීමට හැකි වූ බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම එම තරගාවලියට ක්‍රිකට් කණ්ඩායම් 13ක් සහභාගී වූ බව ද, එහි දී කණ්ඩායම් වල නිලධාරීන් අතර සහයෝගයෙන් ක්‍රියාකරනු දක්නට ලැබූ බව ද එතුමන් විසින් සිහිපත් කරන ලද අතර, රෝහලේ වෛද්‍යවරුන් මෙන්ම කම්කරුවන් ද ඉතා සහයෝගයෙන් තරගයන්ට මුහුණ දීම එයට එක් උදාහරණයක්

වශයෙන් දක්වන ලදී. රජයේ සේවකයන් අතර සුහදතාවය වර්ධනය කර ගැනීමට මෙය හොඳ අවස්ථාවක් වූ බව ද, එය ජය පරාජයට වඩා ඉතාමත් උතුම් බව එතුමන් සඳහන් කරන ලදී. ගරු සභාපතිතුමන්, උප සභාපතිතුමන්, නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ ලේකම්තුමිය ඇතුළු නගර සභාවේ සම්පූර්ණ කාර්ය මණ්ඩලයේ කැපවීම තුළින් මෙම ජයග්‍රහණයන් ලබා ගැනීමට හැකි වූ බව නගර සභා ගරු මන්ත්‍රීතුමන් විසින් සඳහන් කරන ලදී.

මෙවර පැවැත්වූ රාජ්‍ය ආයතන අතර ක්‍රීඩා තරගාවලිය මෙන්ම, පළාත් පාලන ආයතන අතර ක්‍රිකට් තරගාවලියක් ද, අවුරුදු උත්සවය ද ඉතාමත් සාර්ථකව පැවැත්වූ බවත්, ඒ කිසිදු අවස්ථාවක දේශපාලනයක් මූලික කර නොගත් බව ද, එසේ වුවත් එම කිසිදු අවස්ථාවකට ප්‍රතිපක්ෂයේ කිසිදු නගර සභා ගරු මන්ත්‍රීතුමකු සහභාගී නොවූ බව ද, සඳහන් කරන ලදී. එය එසේ වුවත් නගර සභා මන්ත්‍රීවරුන්ට අදාල වරප්‍රසාද පමණක් ඉල්ලන බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී. මෙය ගරු සභාපතිතුමාගේ හෝ වෙනත් කිසිවකුගේ හෝ ආයතනයක් නොව සියල්ලන්ගේම ආයතනයක් බව ද නගර සභා ගරු මන්ත්‍රීතුමන් දක්වන ලදී. නගර සභාවේ සියල්ලන්ගේම එකමුතුබව ආදර්ශයක් වශයෙන් පවත්වාගෙන යා යුතු බව ද එතුමන් සඳහන් කරන ලදී.

වරිපනම් එකතු කිරීමේ වැඩසටහනක් දෙහිගස්තලාව ප්‍රදේශයේ පැවැත්වූ බව ද, එහි දී 75%ක හිඟ මුදල් එකතු කර ගැනීමට අවස්ථාව ලැබුණු බව ද නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් සඳහන් කරන ලදී. ඒ සම්බන්ධව උපදෙස් ලබා දුන් ගරු සභාපතිතුමාටත්, කාර්ය මණ්ඩලයටත් ස්තුතිය ප්‍රකාශ කරන බව එතුමන් සඳහන් කරන ලදී. එම අවස්ථාව තම නිවසේ පැවැත්වීම සඳහා අවස්ථාව ලබා දුන් ඉස්මත් මහතාට සහ ෆාහිර් මහතාට ද නගර සභාව වෙනුවෙන් ස්තුතිය පළ කරන බව වැඩිදුරටත් එතුමන් ප්‍රකාශ කරන ලදී.

නගර සභාවේ සියළුම දෙනාගේ ආදරය ගෞරවය දිනාගත් එම්. ජී. ප්‍රේමදාස මහතා වයස අවුරුදු 60 සම්පූර්ණ විම හේතුවෙන් විශ්‍රාම යන බවත්, එතුමන්ගේ විශ්‍රාමික ජීවිතය සර්වප්‍රකාරයෙන් සාර්ථක වීමට ප්‍රාර්ථනා කරන බවත් ගරු නාගරික මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදී.

උතුරු, මධ්‍යම සහ වයඹ පළාත් සභාවන්හි මැතිවරණය ''සතුටයි - නිදහසයි''යන තේමාවෙන් යුතුව ඉතා සාර්ථකව පැවති බව ද, එක්සත් ජාතික පක්ෂයේ සහ ජනතා විමුක්ති පෙරමුණේ පිරිස් මේ සම්බන්ධව නොයෙකුත් වැරදි ප්‍රකාශයන් සිදු කළත් ජනතාව එයට පිළිතුරු දී ඇති බව ද සඳහන් කරන ලදී. ලක්ෂ තුනක් ඉක්මවමින් ඡන්ද ලබාගෙන වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් තේරී පත් වූ දයාසිරි ජයසේකර මැතිතුමන්ට තම සුබපැතුම් පිරිනමන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා:**

ගරු උප සභාපතිතුමන් සහ ස්වාමීන් වහන්සේලා ප්‍රකාශ කළ පරිදි ගවයන් ප්‍රවාහනය කළ ලොරියකින් ගවයකු වැටී පාර දිගේ ඇදගෙන ගිය සිද්ධියේ දී එම ලොරිය වටලා අල්ලා ගත් පසු ඒ සම්බන්ධව පොලිසියට පැමිණිලි කළ විට පොලිසියේ ඉහල නිලධාරී මහතකු අදාල ඇමතුමට පිළිතුරු දී ඇති බව ද, මේ සම්බන්ධව ගරු උප සභාපතිතුමන් සහ ස්වාමින් වහන්සේලා වෙතින් තොරතුරු ලබාගෙන නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිස්පතිතුමන් වෙතින්, රත්නපුර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමන් වෙතින් සහ බලන්ගොඩ පොලිස් ස්ථානාධිපතිතුමන්ගෙන් ඉල්ලා සිටින බව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් ප්‍රකාශ කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් ද ප්‍රකාශ කර ඇති පරිදි, පල්ලෙකුඹුර මාර්ගය දීර්ඝ කාලයක සිට අබලන්ව පවතින බැවින් එය සංවර්ධන කරදෙන ලෙස එතුමන් ඉල්ලා සිටින ලදී.

පසුගිය මහා සභාවේ දී සංවාදයට ලක් කළ පරිදි දෙහිගස්තලාව සුබයිර් අලීම් මාවත සංවර්ධනය සඳහා ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසර් මුස්තෆා මැතිතුමන් වෙතින් නගර සභා

ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් වෙත ප්‍රතිපාදන ලබා දී ඇති බව ද, නීත්‍යානුකූල පදනමක් නොමැතිව, තනි පුද්ගලයකු විසින් කරන ලද වරදක් සකස් කිරීමට ජාතික ධනයෙන් රුපියල් මිලියනයක මුදලක් ලබා දීම පිළිබඳ හෘදය සාක්ෂියට එකඟව තම කණගාටුව පළ කරන බව ද එතුමන් සඳහන් කරන ලදී.

මෙම සභාවේ ඇතැම් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා කා කිරීමේ දී සංයමයකින් තොරව අදහස් ඉදිරිපත් කරන බව ද, ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න සාවදානව, සෞම්‍ය ආකාරයෙන් සාකච්ඡා කර පිළියම් යෙදීම මෙම සභාවේ දී කළ යුතු බව ද, මෙය දේශපාලන වේදිකාවක් බවට පත් කර, ගරු සභාපතිතුමන් හෝ ගරු අමාත්‍යතුමන්ලා හෝ පුම්බා තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ඇති තැනක් නොවන බව නගර සභා ගරු මන්ත්‍රීතුමන් සඳහන් කරන ලදී. මෙම සභාවේ දී අදාල නොවන දෑ කතා නොකළ යුතු බව ද, මෙම ස්ථානයට මාධ්‍යවේදීන් ද පැමිණෙන බැවින් සියළු දෙනාගේ අවධානය යොමු වන නිසා මෙන්ම මෙම සභාව සියළු දෙනාගේම ප්‍රශංසාවට ලක්ව ඇති බැවින් ද, ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු බව ද, මහජනයා ඉදිරියේ විහිලුකරුවන් නොවී මන්ත්‍රීතුමන්ලා වෙත ඇති ගරු නාමය ආරක්ෂා කර ගත යුතු බව ද, එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

සභාවේ දීර්ඝ කාලයක් සේවය කරමින්, වර්තමාන ගරු සභාපතිතුමන් මෙන්ම මෙම සභාවේ හිටපු ගරු සභාපතිවරයකු වූ තම පියාණන් සමග ද, ඉතා අවංකව සහ විශ්වසනීයව සියළු දෙනාට සමානව සලකා කටයුතු කර ඇති එම්. ජී. ජේමදාස මහතාගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීමට සුභපතන බව ද නගර සභා ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

**14:04 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමාඃ**

අතිගරු ජනාධිපතිතුමාට සහ රජය විසින් සිදු කරන සංවර්ධන වැඩසටහන් වලට සහයෝගය පළ කරමින් පසුගිය පළාත් සභා මැතිවරණයෙන් ජයග්‍රහණය ලබා දුන් ජනතාවට ගෞරවනීය ස්තුතිය පළ කරන බව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමන් නගර සභා මන්ත්‍රීධුරයට පත් වීමට පෙර සිටම හොඳින් හඳුනාගෙන සිටි මෙම නගර සභාවේ ගරු සභාපතිතුමන්ලා කිහිප දෙනෙකු යටතේ ඉතාමත් සුහදශීලීව කාර්යාල කාර්ය සහායක වශයෙන් සේවය කළ එම්. ජී. ජේමදාස මහතාගේ විශ්‍රාම දිවියට සුභ පතන බව, ඉතාමත් වෙනස් අභියෝගකාරී තත්ත්වයක් යටතේ ඒවා සමනය කරගනිමින් සේවය කළ එතුමන් රාජ්‍ය සේවයේ ඉතා උසස් පුද්ගලයකු වශයෙන් සැලකිය හැකි බව ඔහු සම්බන්ධයෙන් වන අතීත මතක සටහන් ආවර්ජනය කරමින් ගරු මන්ත්‍රීතුමන් විසින් සඳහන් කරන ලදී.

එතුමන් වැඩි දුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කළේ මැණික් කඩ කාමර සම්බන්ධයෙන් කඩිනම් අවධානය යොමු කර පඩිපෙල පිළිසකර කළ යුතු බවයි. එම පඩිපෙල අබලන්ව තිබීම හේතුවෙන් කිහිප දෙනෙක්ම පසුගිය දින වල දී අනතුරට ලක් වූ බව ද එතුමන් විසින් සිහිපත් කරන ලදී.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමාඃ**

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් අදහස් දක්වමින් ප්‍රකාශ කළේ, බස් නැවතුම්පොල ඔරලෝසුවක් සවි කිරීමට යෝජනා කල ද තවමත් එය සිදු වී නොමැති බවයි.

එමෙන්ම විශ්‍රාම දිවියට පිවිසෙන මෙම සභාවේ කාර්යාල කාර්ය සහායක එම්. ජී. ජේමදාස මහතා හට දීර්ඝායුෂ පතන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:06 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා:**

බලන්ගොඩ නගරයේ විශාල අඩුපාඩුවක්ව පවතින රාජ්‍ය ඔසුසැලක් ආරම්භ කිරීම සඳහා ඉල්ලීමක් කළ යුතු බව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජ්. මලික් ෂා මැතිතුමන් ප්‍රකාශ කරන ලදී.

මහජන පුස්තකාලයට පිවිසෙන පඩිපෙල ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව ද එතුමන් විසින් සභාවට ස්තුතිය පළ කරන ලදී.

එතුමන් වැඩිදුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කළේ, විශ්‍රාම දිවියට පිවිසෙන ඉතාමත් සුහදශීලී සහ අවංක රාජ්‍ය සේවකයකු වූ එම්. ජී. පේමදාස මහතාට සුභපතන බවයි.

**14:07 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා:**

තමන් නගර සභාවට පත් වූ 1991 වර්ෂයේ සිටම අවුරුදු 23ක් තිස්සේ ඉතා සමීපව සහෝදරයකු වශයෙන් කටයුතු කළ, ඕනෑම කාර්යයක් ඉතාමත් හොඳින් ඉටු කළ, ඉතාමත් ධර්මානුකූල ජීවිතයක් ගත කරන එම්. ජී. පේමදාස මහතාගේ විශ්‍රාම ජීවිතයට තම සුභපැතුම් එක් කරන බව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. තම දරුවන් ද සමාජයේ ඉහල තනතුරු වලට ගෙන ඒමට කැපවී කටයුතු කළ ඔහු තම ඉදිරි විශ්‍රාමික ජීවිතය ඉතා දැහැමිව ගත කරනු ඇති බවට එතුමන් විශ්වාසය පළ කළේය.

**14:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා:**

රාස්සගල පාර කසළ එකතු කිරීමේ කටයුතු නිසි පරිදි සිදු නොවන බැවින් ඒ සම්බන්ධව අදාල රියදුරු දැනුවත් කර එම කටයුතු කරන මෙන් ගරු උප සභාපතිතුමන් විසින් ඉල්ලන ලදී.

නගර සභාවේ සහ සේවාලාභීන්ගේ ප්‍රසාදයට ලක් වෙමින්, අවංකව, කිසිදු බේදයකින් තොරව රාජ්‍ය සේවයේ කටයුතු කළ එම්. ජී. පේමදාස මහතා හට ඉදිරි විශ්‍රාම ජීවිතය නිදුක් නිරෝගීව කටයුතු කිරීමට හැකියාව ලැබීමට ප්‍රාර්ථනා කරන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

පළාත් පාලන සතිය වෙනුවෙන් පැවැත්වූ රාජ්‍ය සේවා ක්‍රීඩා තරගාවලිය ඉතා සාර්ථකව අවසන් වූ බව ද, සංවිධාන කමිටුව විසින් එය ආදර්ශමත් ලෙස පැවැත්වීමට තීරණය කළ බව ද, ඉදිරියේ ද එවන් කටයුතු සඳහා පක්ෂ - ප්‍රති පක්ෂ සියළු දෙනාගේ දායකත්වය ලැබෙනු ඇති බව ද එතුමන් වැඩිදුරටත් අදහස් දකවමින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය මැතිවරණ ජයග්‍රහණය නිහතමානීව භුක්ති විඳිය යුතු බව ගරු උප සභාපතිතුමන් සඳහන් කරන ලදී. නමුත් මෙම මැතිවරණයේ දි ගරු අමාත්‍යතුමන්ලාගේ සමීප ඥාතීන් ඉදිරිපත් කර ඇති බව ද, ඔවුන් රුපියල් කෝටි ගණනින් වියදම් කරන බව ද, මේ හේතුවෙන් පළාත් පාලන ආයතන මට්ටමේ බිහිවන ගරු සභාපතිතුමන් වැනි දක්ෂ නියෝජිතයන්ට ඉදිරියට ඒමට අවස්ථාව අඩු වන බව ද සඳහන් කරන ලදී. එමෙන්ම වාර්තාවක් තබමින් වයඹ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යධූරයට පත් වූ දයාසිරි ජයසේකර මැතිතුමන්ට සුභ පතන බවත්, එතුමන්ට එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද දායකයන්ටත් වඩා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද දායකයන්ගේ ප්‍රසාදය හිමි වූ බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. මේ ඡන්ද ප්‍රතිඵලය ගැන සතුටු වුවත් උතුරු පළාතේ ජාතිවාදීන්ට ජයග්‍රහණය හිමි වී ඇති බව ද, මේ ආකාරයේ හේතුන් නිසා අනාගතයේ ඇතිවන තත්ත්වයන් සම්බන්ධව බියක් ඇති වන බව ද සඳහන් කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමන් සභාව අමතමින්, දෙහිගස්තලාව සුබයිර් අලීම් මාවත සංවර්ධනය පෞද්ගලික කාරණාවක් මත සිදු නොවූ බව සඳහන් කරන ලදී. එය මුස්ලිම් ජනතාව විසින් ප්‍රයෝජනයට ගන්නා මාර්ගයක් බවත්, එහි ජලය බැසයාමට තිබූ හිස් ඉඩමක නීත්‍යානුකූලව නිවසක් ගොඩනැගූ අතර, ජලය බැස නොයාම හේතුවෙන් මාර්ගය ප්‍රයෝජනයට ගන්නා ජනතාවට ඇති වූ අපහසුතාවය නිසා නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා සහ ආයෝජන ප්‍රවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසර් මුස්තෆා මැතිතුමන් වෙතින් ඒ සම්බන්ධව ඉල්ලීම් කළ පසු එතුමන්ලා විසින් 'ජාතික සවිය - ගම නැගුම' වැඩසටහන යටතේ ලබා දුන් ප්‍රතිපාදන මත රු. ලක්ෂ 2 ක් පමණ වන ප්‍රජා දායකත්වය ද සහිතව නිම කරන ලද මාර්ගයක් බවත් සඳහන් කරන ලදී. එබැවින්, මෙය පෞද්ගලික හේතුවක් මත සිදුකරන ලද සංවර්ධන කාර්යයක් බවට නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් සඳහන් කිරීම සුදුසු නොවන බව ගරු සභාපතිතුමන් විසින් පැහැදිලි කරන ලදී.

පසුගිය කාලයේ බංගලාදේශ දූත පිරිසක් මෙම සභාවේ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය නිරීක්ෂණයට පැමිණි අවස්ථාවේ දී එම නිවසේ නවාතැන් පහසුකම් ලබා දීමට හැකි වූ බව ද එතුමන් විසින් සිහිපත් කරන ලදී.

දේශපාලන බේදයකින් තොරව සියලු දෙනාටම සේවාවක් කිරීමට මෙම සභාවට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මෙදින මහා සභාවට සහභාගී වූ ගරු උප සභාපතිතුමා, නගර සභා මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළු දෙනාට ස්තුතිවන්ත වෙමින් 2013 සැප්තැම්බර් මාසයට අදාල මහා සභා රැස්වීම ප.ව. 1.00ට පමණ අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.